# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,212 — 1960 ඔක්තෝබර් 14 වැනි සිකුරාද — 14.10.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු, ඇබෑර්තු ... ... | 763 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 766 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 767 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 773 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 776 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා ඉඩහී සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධ්‍යාපනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාපි සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිද්ධ වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදී ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉනා ඇතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉනා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක්. කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## ගුවන් විදුලි දෙපාර්තමේන්තුව

### 3 වැනි ශ්‍රේණියේ කාර්මික සහායක තනතුර

මෙම දෙපාර්තමේන්තුවේ 3 වැනි ශ්‍රේණියේ කාර්මික සහායක තනතුරක් සඳහා දැන් අයදුම්පත් භාරගනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූලව ඉදිරිපත් කළයුතු අයදුම්පත් 1960 ඔක්තෝබර් 28 වැනි දින හෝ ඊට ප්‍රථම හෝ ලැබෙන සේ කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ, ගුවන් විදුලි අධ්‍යක්ෂ-ජනරාල් වෙත එවිය යුතුය.

**2. වාර්ෂික වැටුප් ක්‍රමය.**—රු. 1,860—120—රු.2,580.

**3. සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑම අයදුම්කරුවෙකු විසින් ම සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) 1960 ඔක්තෝබර් 28 වන දිනට, වයසින් අවුරුදු 20 ට නොඅඩු බවත්, 35 ට නොවැඩි බවත් (දැනට ම රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් කෙරේ මෙම වයස් සීමා බල පවත්වන්නේ නැත.) ;

(ii) විශිෂ්ඨ චරිත සුබියක් ඇති බව ;

(iii) (අ) විෂයයන් වශයෙන් ගණිතය, භෞතික විද්‍යාව සහ/හෝ රසායන විද්‍යාව සහිතව (ඉංග්‍රීසි/සිංහල/දෙමළ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සමාන විභාගයකින් හෝ වඩා උසස් විභාගයකින් හෝ සමත් වී සිටින බව ; **සහ**

(ආ) සිටි ඈන්ඩ් ගිල්ඩ්ස් ඔෆ් ලන්ඩන් ඉන්ස්ටිට්‍යුට් හි—

විදුලි සන්දේශය සඳහා ගණිතය II
විදුලි සන්දේශ මූල ධම් I
රේඩියෝ I
රේඩියෝ II
විදුලි සන්දේශ මූල ධම් II

යන පරීක්ෂණවලින් කිසියම් හතරකින් සමත් වී සිටින බවට ; **එසේ නැත්නම්**

(iv) (අ) (ඉංග්‍රීසි/සිංහල/දෙමළ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් බවට ද,

(ආ) ගුවන් විදුලි ශිල්පය පිළිබඳ සය අවුරුද්දකට නොඅඩු පළපුරුද්දක් ඇති බවටද,

(ඇ) සිටි ඈන්ඩ් ගිල්ඩ්ස් ඉන්ස්ටිට්‍යුට් (ලන්ඩන්) හි—

රේඩියෝ කොමියුනිකේෂන්, 1 වැනි ශ්‍රේණිය
රේඩියෝ කොමියුනිකේෂන්, 2 වැනි ශ්‍රේණිය
විදුලි සන්දේශ මූල ධම්, 1 වැනි ශ්‍රේණිය
විදුලි සන්දේශ මූල ධම්, 2 වැනි ශ්‍රේණිය
විද්‍යුත් ඉංජිනේරු පරිචය (ප්‍රාථමික)

යන්නෙන් කිසියම් තුනකින් සමත් බවට ද සහතික ඉදිරිපත් කිරීමට හැකි බව.

**4. පත් කිරීමේ කොන්දේසි.**—තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම මුල් වතාවට දෙනු ලබන්නේ 3 වසක සෝදිසි කාලයකටය.

5. අයදුම්කරුවන් විසින් සවකීය අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් ලියවිලි නොව අමුණා එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය, (බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරන ලද සහතික පිළිගනු නොලැබේ.) ;

(ii) උසස් ම අධ්‍යාපනික සුදුසුකම දක්වෙන සහතිකය ; සහ

(iii) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, සුරත්වය සහ මෙම තනතුරට පත් කිරීම සඳහා යෝග්‍යත්වය දක්වෙන, මෑතක දී ලබාගත් සහතික දෙකක්.

**සැළකිය යුතුය.**—මෙම සහතික පිටපත් අයදුම්කරු වෙත පෙරළා එවනු නොලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිට ය.

6. නියමිත දිනය ඉක්මවා මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත්, එම නියමිත දිනයට පළමු ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබී ඇත්නම් සහ ප්‍රමාදයට වලංගු හේතු දක්වමින් එය පිළිගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළහොත් මිස පිළිගනු නොලැබේ.

7. මෙම කාරණය හා අදාළ සියලු ලියකියවිලි ඉදිරිපත් කළ යුත්තේ ගුවන් විදුලි අධ්‍යක්ෂ-ජනරාල් නමට මිස, මෙම දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම් හා අදාළ, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළවන පොදු කොන්දේසි කරුණාකර බලන්න.

9. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

පී. ජී. ගුණරත්න,
ගුවන් විදුලි අධ්‍යක්ෂ-ජනරාල්.

1960 ඔක්තෝබර් 14 දින,
කොළඹ 7,
ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ දී.

### ආදර්ශ ආකෘතිය

### 3 වැනි ශ්‍රේණියේ කාර්මික සහායක තනතුර

1. සම්පූර්ණ නම (අච්චු අකුරෙන්) :————.
   (අ) වාසගම (හෙවත් අගට යෙදෙන නම) :————.
   (ආ) සෙසු නම් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. (අ) 1960 ඔක්තෝබර් 28 වැනි දිනට නියම වයස : අවුරුදු——, මාස——, දවස්——.
   (ආ) උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ හෝ විශේෂ වයස් සහතිකයේ පිටපත ඇමිණිය යුතුය).

4. ලාංකිකත්වය—

(i) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද පෙළපතින් ද යන්න :————.

(ii) ලාංකිකත්වය පෙළපතින් නම් පහත සඳහන් අය උපන් තැන දන්වන්න :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

5. අධ්‍යාපනික සුදුසුකම් :————.
(ඉහත 3 (iii) (අ) අනුව හෝ 3 (iv) (අ) අනුව හෝ ඇමිණිය යුතු සහතික පිටපත්)

6. කාර්මික සුදුසුකම් :————.
(ඉහත 3 (iii) (ආ) අනුව හෝ 3 (iv) (ඇ) අනුව හෝ ඇමිණිය යුතු සහතික පිටපත්)

7. තෝරාගැනීමේදී සලකා බැලීමට ප්‍රයෝජනවත් වන විශේෂ ඉල්ලීම්, සුදුසුකම් හෝ පළපුරුද්දක් හෝ ඇත්නම්, එහි විස්තර :————.

8. යුද සේවයේ සිටි අය වෙනුවෙන් පැවරෙන අනුග්‍රහ බලාපොරොත්තු වෙන්නේ ද යන වග (එසේ නම් යුද සේවයෙන් අස්වීමේ ලියවිල්ල හෝ එවැනි වෙනත් සාක්ෂියක් මේ සමග අමුණා එවිය යුතුයි) :————.

9. චරිත සහතික ලබා එවූ අයගේ නම් සහ ලිපින :————.

10. කිසිවිටෙක රජයේ සේවයේ යෙදී සිටියේ නම් ඒ කවදා කොතැන ද යන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-257

---

## බත්තුලුඔය සංචාරක නිවාස භාරකරුගේ තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පුත්තලමේ ආණ්ඩුවේ ඒජන්ත තුමන් විසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. මෙ තනතුර සඳහා වාර්ෂික ස්ථිර වේතනය රුපියල් 270 කි. ඊට නියමිත තාවකාලික ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර මුදල් ආණ්ඩුවේ සංඛ්‍යා අනුව ලැබේ.

3. පත්වීම සථිරය. නමුත් විශ්‍රාම වැටුප් රහිතය.

4. සංචාරක නිවාස භාරකාර පදවිය සතියේ දින 7තෝම සේවයෙහි නිරතවිය යුතු පඬක්තියට අයත් හෙයින් ආණ්ඩුවේ නිවාඩු දිනයන් පත්වීම කෙරේ බලපවත්වනු නොලැබේ.

5. ඉල්ලුම්කරුවන් 1961 ජූලි මස 1 වැනි දිනට වයස අවුරුදු 25 ට අඩු නොවූ ලාංකිකයන් විය යුතුයි. සංචාරක නිවාස හෝ විවේකාගාර හෝ භෝජනාගාර හෝ එවැනි වෙනත් ආයතන පාලනය කර පළපුරුද්දක් ඇති අය පමණක් ඉල්ලුම් කළ යුතුයි. සිංහල හෝ දෙමළ කියවීමට හා ලිවීමටත් ඉංග්‍රිසි කථාකිරීමට හා තේරුම් ගැනීමටත් හැකි අය ගැන විශේෂයෙන් සලකනු ලැබේ. පෙරදිග හා අපරදිග ආහාර සකස් කිරීමේ පළපුරුද්ද අවශ්‍ය සුදුසුකමක් වන්නේ ය.

දැනට ආණ්ඩුවේ සේවය කරන වයස අවුරුදු 40 ඉක්මගිය අයගේද ඉල්ලුම් පත්‍ර ගැන කල්පනා කරනු ලැබේ.

6. තෝරාගත් ඉල්ලුම්කරු තුන් අවුරුදු කාර්ය පරීක්ෂණයට අයත් ය. එමෙන්ම ආණ්ඩුවේ විධි විධානද ඔහු කෙරේ බලපැවැත්වේ.

7. තෝරාගත් ඉල්ලුම්කරු තනතුර ඉසිලීමට යෝග්‍ය සෞඛ්‍ය තත්වයේ සිටින බැව් වෛද්‍ය පරීක්ෂණයකදී ඔප්පුවිය යුතුයි. තවද ඔහු අවුරුදු පතා වෛද්‍ය පරීක්ෂණයකට භාජන විය යුතුයි.

8. තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු විසින් රුපියල් 150 ක ඇපයක් තැබිය යුතුයි. මෙය මුලින් රුපියල් 40ක් තැන්පත් කර ඉතිරි මුදල මාස්පතා රු. 5 බැගින් ගෙවා සම්පූර්ණ කළහැක.

9. තෝරාගත් ඉල්ලුම්කරු ඔහුගේ වැටුපෙන් සියයට 5 ක් ප්‍රසිඩ සේවා අර්ථසාධක අරමුදල සඳහා යෙදිය යුතුයි.

10. ඉල්ලුම් පත්‍රයට පහත දක්වන ලියවිලි ඇමිණිය යුතුයි :—

(අ) බී 78 ඒ දරණ ආකෘති පත්‍රයේ නිකුත් කෙරෙන උප්පැන්න සහතිකය.

(ආ) ඉගෙණීම පිළිබඳ සහතික.

(ඉ) ගතිගුණ හා ක්‍රියා පිළිබඳ ලඟදී ලබාගත් සහතික තුනක්.

11. දැනට ආණ්ඩුවේ ආයතනවල සේවයේ සිටින්නන් විසින් ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන්නේ ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවුවහොත් පමණි.

12. ඉල්ලුම්කරු සුදුස්සෙකු බව පෙන්වීමට යමෙක් අරමුණු කරන්නේ නම් එය සහතිකයක් නිකුත් කිරීමෙන් කළ හැකිය. එක් ඉල්ලුම්කරුවකු තෝරා ගැනීම සඳහා යමෙකු උනන්දු කරවන්නේ නම් හෝ තෝරාගැනීම සඳහා සහාය ලබා දීමට උත්සාහ කරන්නේ නම් එය ඉල්ලුම්කරුගේ නුසුදුසු කමක් හැටියට සැලකෙනවා ඇත.

13. අසත්‍ය ප්‍රකාශයන් කිරීමෙන් ඉල්ලුම්කරු තෝරා ගැනීමේදී නුසුදුස්සෙක් වේ. එමෙන්ම පත්වීමෙන් පසුව එවැනි අසත්‍ය කාරණයක් එළිදරව් වුවහොත් තනතුරින් නෙරපා හරිනු ලැබේ.

14. ඉල්ලුම්කරුවන් නියම කරන ලද දිනකදී සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි. ඒ සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා නොලැබේ.

15. මේ සමග ඇති උප ලේඛනයෙහි දක්වෙන ආකෘති පත්‍රයේ පරිදි සම්පූර්ණ කරණ ලද ඉල්ලුම් පත්‍ර 1960 ඔක්තෝබර් 20 වැනි දින හෝ ඊට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ දිසාපති තුමා වෙත ලැබෙන සේ එවිය යුතුයි. කිසිම ඉල්ලුම් පත්‍රයක් පුද්ගලිකව මාවෙත නොඑවිය යුතුයි.

ජෝර්ජ් මැක්ස්වෙල් ස්පාර්ක්ස්,
පුත්තලමේ දිසාපති.

1960 ඔක්තෝබර් මස 7 දින,
පුත්තලම් කච්චේරියේ දීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

**බත්තුලුඔය සංචාරක නිවාසයේ භාරකරුගේ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ජාතිය :————.
(ලාංකික හෝ නොවේද යන බව සඳහන් කරන්න)

4. ඉල්ලුම්කරු උපන් දිනය සහ ස්ථානය :————.

5. ඉල්ලුම්කරුගේ පියා උපන් දිනය සහ ස්ථානය :————.

6. ඉල්ලුම්කරු විවාහකද අවිවාහකද යන බව :————.

විවාහක නම් යැපෙන්නන්ගේ ගණන :————.

7. අධ්‍යාපන සුදුසුකම් :—
සමර්ථවූ අවසාන පාඨ පරීක්ෂණය සහ දිනය :————.

8. අධ්‍යාපනය ලත් ස්ථානය සහ අස්වූ දින :————.

9. (අ) පාසැලින් අස්වීමෙන් පසු කරණ ලද රක්ෂා, දින හා සම්පූර්ණ විස්තර :————.

(ආ) කලින් ආණ්ඩුවේ රක්ෂාවක යෙදී සිටියානම් ඒ පිළිබඳ විස්තර සහ රක්ෂාවෙන් ඉවත් වීමට හේතු :————.

(ඉ) මධ්‍යම ආණ්ඩු හෝ ප්‍රාදේශීය ආණ්ඩු පාලනයට යටත් සංචාරක නිවාසයක සේවය කරන්නෙක් නම් :

(i) දැනට දරණ තනතුරේ ශ්‍රේණිය හා පත්වීමේ දිනය : ————.

(ii) දැනට ලබන වැටුප සහ වැටුප් ක්‍රමය :————.

(iii) සේව්‍ය සටහන් සහ දින :————.

10. සිංහල දැනීම, කියවීම, ලිවීම :————.

සිංහල සහ දෙමළ පරිවර්තනය කර කථා කිරීමේ දැනුම :————.

11. විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.

12. සහතික පත් ලබාගත් අයගේ නම් සහ තනතුරු :————.

13. විශේෂ ඉල්ලීම් හෝ සංචාරක/විවේකාගාර කටයුතු පිළිබඳ පළපුරුද්ද :————.

14. උසාවියකින් අපරාධ පිළිබඳ වරදකට දඬුවම් ලබා තිබේද? එසේ නම් නඩුවේ අංකය, දිනය හා අපරාධයේ සවභාවය සටහන් කරන්න :————.

15. ණයතුරුස් වලින් නිදහස් ද යන බව :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10-269

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය: 1/83/9 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ (ඉංග්‍රීසි) පරීක්ෂණය—1960 ජූලි

වර්ෂ 1960 ක්වූ ජූලි මස 16 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී පහත සඳහන් අස්ථිර සහ පරීක්ෂණ කාල සීමාවනට යටත්ව පත්වීම් ලබා ඇති ලඝු ලේඛකයන් සහ ලඝු ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන්කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි:—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| ඒකනායක, වී. එච්. ඒ. | කම්කරු ... | ලඝු ලේඛනය |
| ඩයස්, කේ. ඒ. ... | විදුලි බල ... | ලඝු ලේඛනය. සිංහල විෂයයෙන් නිදහස් කරන ලදී. |
| නානායක්කාර, ටී. පී. එච්. | දිස්ත්‍රික් උසාවිය, මාතර | ඉංග්‍රීසි |
| නුගේරා, එච්. ඊ. ... | ගුවන් විදුලි ... | ඉංග්‍රීසි |
| පතිරණ, එල්. අයි. ... | පොලිස් ... | සිංහල |
| පෙරේරා, ජේ. ඒ. වී. ජේ. | මහෙස්ත්‍රාත් උසාවිය, මීගමුව | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, එම්. එච්. ජේ. | රාජකීය ලංකා නාවුක හමුදව | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, එම්. ආර්. බී. (මෙනෙවිය) | රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශය | සිංහල |
| බොක්ස්, ජේ. ජේ. ජී. | විදුලි බල ... | ඉංග්‍රීසි |
| රාජසූරිය, කේ. එස්. ... | පොලිස් ... | ඉංග්‍රීසි. සිංහල විෂයයෙන් නිදහස්කරන ලදී. |
| වීරසිංහ, ජේ. ... | මහෙස්ත්‍රාත් උසාවිය, හලාවත | සිංහල |
| සූරියආරච්චි, ඊ. ... | කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග හා විදුලි බල අමාත්‍යංශය | ලඝු ලේඛනය |
| හාඩන්; බී. (මහත්මිය) | දේශීය ආදායම් ... | සිංහල |

2. පහත සඳහන් අපේක්ෂකයන් පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් දන් සමර්ථ වී ඇත:—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ඩයස්, කේ. ඒ. ... | විදුලි බල |
| පෙරේරා, ජේ. ඒ. වී. ජේ. ... | මහෙස්ත්‍රාත් උසාවිය, මීගමුව |
| ප්‍රනාන්දු, එම්. එච්. ජේ. ... | රාජකීය ලංකා නාවුක හමුදව |
| සූරියආරච්චි, ඊ. ... | කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යංශය |

හ. එ. පීරිස්.
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 5 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේදීය.

10-278/1

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ විශෙෂ පරීක්ෂණය (ඉංග්‍රීසි)—1960වේ ජූලි

වර්ෂ 1960 ක්වූ ජූලි මස 16 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ විශෙෂ පරීක්ෂණයේ දී පහත සඳහන් අස්ථිර සහ පරීක්ෂණ කාල සීමාවනට යටත්ව පත්වීම් ලබා ඇති ලඝු ලේඛකයන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන්කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම්දෙමි: —

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| ඩැන්පත්, ඒ. ටී. ... | කච්චේරිය, යාපනය ... | ඉංග්‍රීසි සහ දෙමළ |
| ස්ටෙම්බෝ, එම්. ටී. එන්. | පෝට් කොමිෂන් ... | ලඝු ලේඛනය සහ සිංහල |

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක්වූ ඔක්තෝබර් මස 5 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දීය.

10-278/2

භාණ්ඩාගාරයේ අංකය:- 1/83/9 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ඉංග්‍රීසි)—1960වේ ජූලි

වර්ෂ 1960 ජූලි මස 16 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940 ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී පහත සඳහන් ලඝු ලේඛකයන් සහ ලඝු ලේඛිකාව ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන්කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| කමින්, ජේ. ... | තේ පිටරට යැවීමේ ... | ලඝු ලේඛනය |
| කොක්, ඩබ්ලිව්. එම්. ... | අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයය ... | සිංහල |
| පර්ඩිනැන්ඩස්, වී. ඩබ්ලිව්. | ක්‍රම සම්පාදක ලේකම් කාර්යාලයය | ලඝු ලේඛනය |
| පෙරේරා, ඒ. ... | දිස්ත්‍රික් උසාවිය, රත්නපුර | ලඝු ලේඛනය |
| පෙරේරා, එන්. එස්. ... | මහා භාණ්ඩාගාරය ... | ලඝු ලේඛනය, රචනය හා සිංහල |
| ප්‍රනාන්දු, එම්. ඒ. ... | ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය, කොළඹ | සිංහල |
| මෙන්ඩිස්, බී. එම්. කේ. | රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ | ලඝු ලේඛනය හා රචනය. සිංහල විෂයයෙන් නිදහස් කරන ලදී. |
| ලියනආරච්චි, ඒ. ජී. (මෙනෙවිය) | කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග හා විදුලිබල අමාත්‍යංශය | ලඝු ලේඛනය |
| වීරසිංහ, ඩී. වී. පී. ... | ක්‍රම සම්පාදක ලේකම් කාර්යාලය ය | ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂකයන් සහ අපේක්ෂිකාව සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට දන් සුදුසුකම් ලබා ඇත:—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| කමින්, ජේ. ... | තේ පිටරට යැවීමේ |
| කොක්, ඩබ්ලිව්. එම්. ... | අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයය |
| පර්ඩිනැන්ඩස්, වී. ඩබ්ලිව්. ... | ක්‍රම සම්පාදක ලේකම් කාර්යාලයය |
| පෙරේරා, එන්. එස්. ... | මහා භාණ්ඩාගාරය |
| පෙරේරා ඒ. ... | දිස්ත්‍රික් උසාවිය, රත්නපුර |
| ප්‍රනාන්දු, එම්. ඒ. ... | ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය, කොළඹ |
| මෙන්ඩිස්, බී. එම්. කේ. ... | රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ |
| ලියනආරච්චි, ඒ. ජී. (මෙනෙවිය) | කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල අමාත්‍යංශය |
| වීරසිංහ, ඩී. වී. පී. ... | ක්‍රම සම්පාදක ලේකම් කාර්යාලයය |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයන් සහ අපේක්ෂිකාව ද, එම පරීක්ෂණයට ඇතුළත්වීමේ සුදුසුකම් මීට කලින් ලබා ඇති අයද, මීළඟ සම්මෙලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම සඳහා තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මඟින් විභාග කොමසාරිස්වරයාවෙත ලියාපදිංචි කළ තැපැලෙන් යවන ලද ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 ඔක්තෝබර් මස 5 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

10-278/3

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ විශෙෂ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ඉංග්‍රීසි)—1960 ජූලි මස

වර්ෂ 1960 ජූලි මස 16 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ විශෙෂ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛකයන් සහ ලඝු ලේඛිකාව ද ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන්කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි:—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| අබේගුණවර්ධන, සී. ආර්. ඩී. | මහා භාණ්ඩාගාරය ... | ලඝු ලේඛනය |
| ඒකනායක, සී. එෆ්. එන්. ද එස් | මෝටර් රථ ගමනාගමන | ලඝු ලේඛනය හා රචනය |

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| වාවි, බී. එස්. ජේ. | ... මහා භාණ්ඩාගාරය | ... ලඝු ලේඛනය |
| ත්‍යාගරාජා, වී. | ... දිස්ත්‍රික් උසාවිය, යාපනය | ලඝු ලේඛනය |
| දල්පද්දු, කේ. ජේ. එම්. සී. | රික්වැස්ට් උසාවිය, කොළඹ | රචනය හා සිංහල |
| දල්පද්දු, කේ. ඩබලිව්. වී. | කම්කරු ... | සිංහල |
| ප්‍රනාන්දු, ජේ. එම්. (මහත්මිය) | මුදල් අමාත්‍යාංශය ... | සිංහල |
| ප්‍රනාන්දු, එන්. ඩී. ජේ. | දිස්ත්‍රික් උසාවිය, පානදුර | ලඝු ලේඛනය හා රචනය |
| ප්‍රනාන්දු, පී. වී. | ... රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ | ලඝු ලේඛනය |
| රෙජිනෝල්ඩ්, ජේ. එච්. එල් | කර්මාන්ත ... | ලඝු ලේඛනය |
| රූපසිංහ, කේ. ඒ. ඩබලිව්. ද සී. | මහා භාරකාරතැනගේ ... | ලඝු ලේඛනය |
| ලාසරස්, ජී. | ... පෝට් කොමිෂන් ... | දෙමළ |

2. පහත සඳහන් අපේක්ෂකයන් සහ අපේක්ෂිකාව සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට දැන් සුදුසුකම් ලබා ඇත :

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| අබේගුණවර්ධන, සී. ආර්. ඩී. | ... මහා භාණ්ඩාගාරය |
| වාවි, බී. එස්. ජේ. | ... මහා භාණ්ඩාගාරය |
| ත්‍යාගරජා, වී. | ... දිස්ත්‍රික් උසාවිය, යාපනය |
| දල්පද්දු, කේ. ඩබලිව්. වී. | ... කම්කරු |
| ප්‍රනාන්දු, ජේ. එම්. (මහත්මිය) | ... මුදල් අමාත්‍යාංශය |
| ප්‍රනාන්දු, පී. වී. | ... රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ |
| රූපසිංහ, කේ. ඒ. ඩබලිව්. ද සී.... | මහා භාරකාරතැනගේ |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයන් සහ අපේක්ෂිකාව ද එම පරීක්ෂණයට ඇතුළත්වීමේ සුදුසුකම් මීට කලින් ලබා ඇති අය ද මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම සඳහා තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මඟින් විභාග කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

භ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 ඔක්තෝබර් මස 5 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

10—278/4

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛන සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (සිංහල)—1960 ජූලි

වර්ෂ 1960 ජූලි මස 23 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940 ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී පහත සඳහන් ලඝු ලේඛකයන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන්කොට ඇති විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි:—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| ජයවර්ධන, කේ. ජී. | ... ගුවන් විදුලි | ... ලඝු ලේඛනය සහ රචනය |
| පියදස, ජී. පී. | ... මහා භාරකාරතැනගේ | ලඝු ලේඛනය සහ රචනය |
| විජේසිංහ, එම්. එච්. එස්. ... | කම්කරු | ... ලඝු ලේඛනය සහ රචනය |

2. ඔවුන් සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට දැන් සුදුසුකම් ලබා ඇත.

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයන් ද එම පරීක්ෂණයට ඇතුළත්වීමේ සුදුසුකම් මීට කලින් ලබා ඇති අයද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම සඳහා තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මඟින් විභාග කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

භ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 ඔක්තෝබර් මස 7 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

10—279/1

---

භාණ්ඩාගාරයේ අංකය: 1/83/9 (ජී)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ (සිංහල) පරීක්ෂණය —1960 ජූලි

වර්ෂ 1960 ක් වූ ජූලි මස 23 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පතවීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී පහත සඳහන් අස්ථිර පත්වීමක් ලබා ඇති ලඝු ලේඛකයා ඔහුගේ නම ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දැනුම් දෙමි:—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය |
|---|---|---|
| පියසේන, එච්. | ... නීති කෙටුම්පත්කරුගේ | ලඝු ලේඛනය |

2. ඔහු පත්වීම ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් දැන් සමර්ථ වී ඇත.

 භ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 ඔක්තෝබර් මස 7 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

10—279—/2

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), ගුදිරි කොනු කෙඳි සහ බ්‍රිස්ටල් (Bristle) කොනු කෙඳි සැපයීම සඳහා 1960 නොවැම්බර් 8 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරිතැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 නොවැම්බර් 7 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඩබ්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 ඔක්තෝබර් 14 වැනි දින,
කොළඹදීය.

10-276

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), අමිශ්‍ර ශාක ටර්පන්ටයින් සැපයීම සඳහා 1960 නොවැම්බර් 22 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරිතැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 නොවැම්බර් 21 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඩබ්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 ඔක්තෝබර් 14 වැනි දින,
කොළඹදීය.

10-277

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### අයි. සී. ඒ. ටෙන්ඩර් දැන්වීමයි

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 නොවැම්බර් 29 වැනි දින පෙරවරු 10 දක්වා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට නැප් සැක්, ඉසිනයන් ආදිය (ටෙන්ඩර් අංක : අයි. සී. ඒ. 287) සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැන ගෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට ටෙන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ශ්‍රී. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 ඔක්තෝබර් 10 වැනි දින,
කොළඹ 2.

10-349

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළදී අම්බලන්ගොඩ මාදම්පේ කාර්මික බඩු ගබඩාවේ සිට 9,25,000 පමණ ලූනු මලු අම්බලන්ගොඩ දුම්රිය ස්ථානයට පටවාගෙන ගොස් භාරදීම සඳහා 1960 ඔක්තෝබර් මස 28 වැනි සිකුරාද දවල් 10 දක්වා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර ෆෝර්ම සහ වෙනත් විස්තර කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ, ගෘහ කර්මාන්ත කොමසාරිස් කාර්යාලයෙන් හෝ මෙම දෙපාර්තමේන්තුවේ දකුණු කොට්ඨාශය භාර ගාල්ලේ කච්චේරියේ පිහිටි ප්‍රාදේශික කාර්යාලයෙන් හෝ අම්බලන්ගොඩ මාදම්පේ කාර්මික බඩු ගබඩාවෙන් හෝ ලබාගත හැකිය.

ඇම්. ඇස්. ශ්‍රීපෙරේරා,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂක තැන.

1960 ක්වූ ඔක්තෝබර් මස 8 දින,
කොළඹ 7.

10-306

---

## 1960-61 වර්ෂයේ මහර බන්ධනාගාරයට අමු පොල්ලෙලි සැපයීම

පහත අත්සන් කරන අය විසින් ටෙන්ඩර් පත්‍ර භාරගත් දින සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුළ රාගම මහර බන්ධනාගාරයට අමු පොල්ලෙහි සැපයීම සඳහා 1960 ඔක්තෝබර් මස 27 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(අ) මුද්‍රා තබන ලද සැම්පල් මහර බන්ධනාගාරයේ අධිකාරිතැන වෙත වෙනම ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රය පමණක් ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

පහත අත්සන් කළ අය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් ලබාගන්නා ලද මුද්‍රිත පත්‍රවල ටෙන්ඩර් සඳහන් කළ යුතුයි. රුපියල් 10ක් මහර බන්ධනාගාර කාර්යාලයේ හෝ කච්චේරියක තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ඉල්ලුම් ලබාගත හැක. නියමිත මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයේ අකුරෙන් සහ අංකවලින් දැක්විය යුතුයි.

මහර බන්ධනාගාරයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන හෝ රෙජිස්ටර් තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා එහි දකුණු කෙළවරේ උඩ "අමු පොල්ලෙහි සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ නියමිත වේලාව ඉකුත්වූ වහාම පහත අත්සන් කරන අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එහි පැමිණිය හැක.

ඊ. ඇල්. ප්‍රනාන්දු,
අධිකාරිතැන,
මහර බන්ධනාගාරය.

1960. 10. 4
රාගම.

10-275

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### රාත්තල් 35-45 රොක් ඩ්‍රිල්ස් සැපයීම

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 නොවැම්බර් මස 15 වැනි අඟහරුවාදා උදේ 10 වන තෙක් රාත්තල් 35-45 රොක් ඩ්‍රිල්ස් 15 ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් අයැදුම් පත් විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර් අයැදුම් කරුවනට ඒ ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ඇත.

රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් අයැදුම් පත් ලියා අනු පිටපතක් ද සමඟ එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 25 ක් රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ලබාගෙන එහි ඉදිරිපත් කළ විට වර්ෂ 1960 නොවැම්බර් මස 11 වෙනි සිකුරාදා වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1960 ඔක්තෝබර් මස 1 වැනි දින,
කොළඹ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදී.

10-200

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු පලාතේ තනිමුරිප්පු යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ මහ ලේකම් ගොඩනැගිල්ලේ 355 වැනි කාමරයේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා ජල විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 නොවැම්බර් 8 වැනි අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග හෝ දුම්රිය හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 1,00,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ සෑහෙන ප්‍රමාණයක පස් වැඩට යෝග්‍ය යන්ත්‍රෝපකරණ ඇති කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ඉල්ලුම් කළ හැක.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 250 ක් වාරිමාර්ග අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 නොවැම්බර් 4 වැනි සිකුරාද දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ වවුනියාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක.

වැඩි විස්තර වවුනියාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතුයි.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ,
1960 ඔක්තෝබර් 4.

10-239

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු දිශාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් පහත සඳහන් වැඩ සඳහා වර්ෂ 1960 ක්වූ නොවැම්බර් මස 8 වෙනි අඟහරුවාද පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| පහත නම් සඳහන් වැඩ කළ යුතුයි | | කොන්ත්‍රාත් කරුවාගේ ලියාපදිංචි ගණන රුපියල් | | තැන්පත් කළ යුතු මුදල රුපියල් |
|---|---|---|---|---|
| 1. නෙඩුන්කානී ආරු (අනිකට්) අමුනේ වැඩ ... | ... | 20,000 | ... | 25 |
| 2. පූතුර් වැවේ ප්‍රතිසංස්කරණය කිරීම | ... | 30,000 | ... | 25 |
| 3. ඉලන්කාත්තුකුලම් ප්‍රතිසංස්කරණය කිරීම | | 45,000 | ... | 25 |

2. ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා එම කවරයේ වම් කෙලවරේ අසවල් වැඩ සඳහායයි විස්තර කළ යුතුයි.

3. වවුනියා උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් වර්ෂ 1960 ක්වූ නොවැම්බර් මස 7 වෙනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

4. තවද මෙයට උවමනා සිමෙන්ති, කොන්ක්‍රීට් පයිප්ප සහ සුලූස් ගේට් සපයනු ලැබේ. වෙන කිසිම ආවුදයක් හෝ බඩු සපයනු නොලැබේ.

5. වැඩි විස්තර සඳහා වවුනියාවේ උ. කො. භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කායඹාලයෙන් ලබාගත හැක.

6. වර්ෂ 1960 ක්වූ නොවැම්බර් මස 8 වෙනි දින පෙරවරු 9.30 ට ප්‍රා. වා. ඉංජිනේරු තුමා, විසින් ටැන්ඩර් ආකෘති පත්‍ර විවෘත කරනු ලැබේ.

වී. බාලසුබ්‍රමනියම්,
වවුනියා උ. කො. භාර වාරිමාර්ග ඉංජිනේරු තැන.

1960.10.6.

10-218

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

නැගෙනහිර පලාතේ, වෙන්කලඩියි, රුගම් උප කොට්ඨාශය තුල බඩු බාහිරාදිය ප්‍රවාහන කිරීම සඳහා මඩකලපුවේ, නැගෙනහිර කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින්, මෙම දෙපාර්තමේන්තුවේ, රු. 10,000 ට සහ ඊට වැඩි ගණන්වලට ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ගෙන්, වර්ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 26 වෙනි දින, පෙ. ව. 9.30 දක්වා ටෙන්ඩර් භාරගන්නවා ඇත.

ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ වර්ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 25 වෙනි දින දක්වා වෙන්කලඩිහි රුගම් උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරු තැනගෙන් ලබාගත හැකි ෆෝර්මවල අනු පිටපත් වශයෙනි.

තවද ටෙන්ඩර් තැන්පත් කිරීම සඳහා මඩකලපුවේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඹාලයේ තබා තිබේන "ටෙන්ඩර් පෙට්ටියේ" ද ටැන්ඩර් තැන්පත් කළ හැක.

මඩකලපුවේ නැගෙනහිර කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් වර්ෂ 1960 ක්වූ, ඔක්තෝබර් මස 26 වෙනි දින, පෙ ව. 10 ට, ඔහුගේ කායඹාලයේදී, ටෙන්ඩර් විවෘතකරනු ලබන්නේය. ඒ අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන් සතුටු නම්, ඔවුන්ට එහි සිටිය හැක.

ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලබන්නේ, ඉහත සඳහන් ගණන්වලට, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, කොන්ත්‍රාත්කරුවන් වශයෙන්, ලියා පදිංචිවී සිටින බවට, ඔප්පුකිරීමට හැකි වුත්, ඔවුන් කොළඹ වාරිමාර්ග අධ්‍යක්ෂ තැන නමට, මුදල් රු. 25 ක් බැන්ද බවට, කුවිතාන්සියක් හෝ මනි ඕඩරයක් ඉදිරිපත් කරන අයවළුන්ට පමණය.

දැනට රජයේ කොන්ත්‍රාත්වල යෙදී සිටින්නවුන්, එම කොන්ත්‍රාත්වල සතුටුදායක දියුණු තත්වයක් ඇතිකර තිබෙන බවට, එකී කොන්ත්‍රාත් වැඩපොලවල් භාර නිලධාරින්ගෙන් සහතික ලබාගෙන, ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන විට, එම සහතික පත්‍රද අමුනා ඉදිරිපත් කළ යුතුයි. වැඩි විස්තර, නැගෙනහිර පලාතේ, වෙන්කලඩිහි, රුගම් උප කොට්ඨාශය භාර, වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

සී. ජයසිං,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
රුගම් උප කොට්ඨාශය.

වාරිමාර්ග කායඹාලය,
වෙන්කලඩි,
1960.9.13.

9585

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මැද පලාත භාර අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් මහකනදරාව උප කොට්ඨාශයේ වම් ඉවුරේ ප්‍රධාන ඇලේ පස්වෙනි සැතැප්මේ මුල් භාගය සහ දෙවැනි භාගය සෑදීම සඳහා වෙන් වශයෙන් 1960 නොවැම්බර් 2 වැනි බදාදා පෙරවරු 10 වන තෙක් ටැන්ඩර් භාරගනු ලැබේ.

රු. 25,000 කට හෝ වැඩි ගණනකට දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් මේ සඳහා සුදුස්සන් වෙති.

සෑම ටැන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා ෆෝර්ම කොල සහ සියලු විස්තර මිහින්තලේ, මහකනදරාව වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක. 1960 ඔක්තෝබර් මස 15 වෙනි දින සිට 29 වැනි දින දක්වා ෆෝර්ම කොල නිකුත් කරණු ලැබේ.

ටැන්ඩර් ෆෝර්ම දෙනු ලබන්නේ කච්චේරියක හෝ මහකනදරාව වාරිමාර්ග කායඹාලයෙහි රුපියල් 25ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කරන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ බවට සහතික පෙන්විය හැකි කොන්ත්‍රාත් කරුවනට පමණි.

ටැන්ඩර් භාර ගැනීම අවසාන කරන දින පෙරවරු 10 ට අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තුමා විසින් ටැන්ඩර් විවෘත කර බලන අවස්ථාවේ ටැන්ඩර් කරුවනට පැමිණ සිටිය හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වාරිමාර්ග ඉන්ජිනේරු
මහකනදරාව උප කොට්ඨාශය.

1960 ඔක්තෝබර් 6 වෙනි දින,
මිහින්තලේ.

10-289

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට රෝද හතරම ඉන්ජිමෙන් ක්‍රියා කරන මෝටර් රථයක් සැපයීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන සින් 1960 නොවැම්බර් මස 4 වැනි දින පස්වරු 2.30 වන තෙක් ඉහත සඳහන් වාහනය සැපයීම සඳහා ආණ්ඩුවේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ෆෝර්ම කොළ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපොලේ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත රු. 100 ක ඇප මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබා ගත හැක. වැඩි විස්තර සඳහා මේ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි ටෙන්ඩර් දැන්වීම බලන්න.

ඒ. ඩී. රිචඩ්ස්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 ඔක්තෝබර් මස 7 වැනි දින,
පේරාදෙණියේ දීය.

10-263

---

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

හම්බන්තොට ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් වර්ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 31 වැනි දින පෙරවරු 10 දක්වා හම්බන්තොට දිස්ත්‍රික්කයේ පහත සඳහන් සුළු වාරිමාර්ග වැඩ සඳහා රජයේ රෙජිස්ටර් කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(1) මාගම් පත්තුවේ අනුක්කන් ගල් වැව අළුත්වැඩියා කිරීම.

(2) මාගම් පත්තුවේ පඩව්කෙම වැව අළුත් වැඩියා කිරීම.

(3) මාගම් පත්තුවේ මීගහජඳුරේ පහළ කුඹුක්වැව අළුත්වැඩියා කිරීම.

(4) මාගම් පත්තුවේ මීගහජඳුර වැව අළුත්වැඩියා කිරීම.

(5) මාගම් පත්තුවේ මීගහජඳුරේ බෝගහ ඉදිවැව අළුත්වැඩියා කිරීම.

(6) නැගෙනහිර ගිරුවා පත්තුවේ හාතාගල පාත අමුණ අළුත්වැඩියා කිරීම.

(7) නැගෙනහිර ගිරුවා පත්තුවේ හාතාගල රතුගම උන්නැහේගෙ අමුණ අළුත්වැඩියා කිරීම.

(8) නැගෙනහිර ගිරුවා පත්තුවේ හාතාගල කරිජ්ජ ඇල බැම්ම අළුත් වැඩියාකිරීම.

(9) නැගෙනහිර ගිරුවා පත්තුවේ වකමුල්ල වම් ඉවුරු ඇලේ අංක 1 ඩී. ගේට්ටුවෙන් යන බස්නාව අළුත්වැඩියා කිරීම.

(10) නැගෙනහිර ගිරුවා පත්තුවේ පන්ගන්විල අමුණේ සිට අත්තනයාල අමුණට වැටී ඇති හල්මිල්ල ඇල අළුත්වැඩියා කිරීම.

3. රු. 250 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද රු. 50 ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද ගෙවූවිට 1961 ජනවාරි මස 31 වෙනිදා දක්වා ටෙන්ඩර් පොත් නිකුත් කරනු ලැබේ. මුදල් ලංකාණ්ඩුවේ විදේශීය නියෝජිතයින්ට ගෙවන්නේ නම් ටෙන්ඩර් තැන්පත් මුදල ස්ටර්ලින් පවුම් 19-0-0 හා ටෙන්ඩර් පෝරම ගාස්තුව ස්ටර්ලින් පවුම්4-0-0ක් ද වේ. ටෙන්ඩර් පෝරම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

4. ටෙන්ඩර් පොත් නිකුත් කරනු ලබන්නේ:—

අ. ලංකාව තුල :—කොළඹ මැකලම් පාරේ පිහිටි රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් හා සැපයීමේ විදුලි ඉංජිනේරු තැන විසින් ය.

ආ. විදේශීය රටවල් තුල:—ලංකාවේ විදේශීය නියෝජිතයින් මගින් ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පිළිබඳ විස්තර කොළඹ මැකලම් පාරේ පිහිටි රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් සහ සැපයීමේ විදුලි ඉංජිනේරු තැනගෙන් දැනගත හැක.

5. වර්ෂ 1961ක් වූ පෙබරවාරි මස 14 වෙනි දින පූ. භා. 10 ට ගාලු මුවදොර මහාලේකම් ගොඩනැගිල්ලේ අංක 355 හේ කාමරයේ පිහිටි කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ.
1960 ක්වූ ඔක්තෝම්බර් මස 14 වෙනි දය.

10-355

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### කුඩු කරන ලද උම්බලකඩ රු. 1/4 පැකට් විකිණීම

කුඩු කරන ලද උම්බලකඩ රාත්තල් කාලේ (රු. 1/4) පැකට් 8,000ක් පමණ මිලදී ගැනීම හා ගෙනයාම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්, 1960 ඔක්තෝබර් මස 25 වැනි අඟහරුවාද අ. භා. 2.30 දක්වා කොළඹ කොටුවේ, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ සංවර්ධන කොමසාරිස් තැන විසින් භාර ගනු ලැබේ.

බඩු තොගය, කොළඹ, ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිව්හි, අංක 401 දරණ ස්ථානයේ පිහිටි අලෙවි සංවර්ධන කිරීමේ දෙපාතීමේන්තුවේ පින්කැම අංශයේදී බලාගත හැක.

ඩබ්ලිව්. ඩී. ඕ. තිලකරත්න,
අලෙවි සංවර්ධන කිරීමේ කොමසාරිස් තැන වෙනුවට.

අලෙවි සංවර්ධන කිරීමේ දෙපාර්තමේන්තුව,
චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානය,
කොළඹ, කොටුව,
1960.10.6 වැනි දිනදීය.

10-256

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන ත්‍රිපොලි වෙළඳ සැලට 1960. 11. 1 සිට 1960. 11. 30 දක්වා ඇති කාලය තුලදී අළුත් බිත්තර සැපයීම පිණිස ටෙන්ඩර් 1960 ඔක්තෝබර මස 24 වැනි දින අපරභාග 2.30 වන තෙක් කොළඹ යූනියන් ප්ලේස්හි පිහිටි වාණිජ, වෙළඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් 1960. 10. 24 වැනි දින දවල් 12 වනතුරු ලබාගතහැකි ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පෝරමවල ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් දැනගතහැක.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවිකිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1960. 10. 10 වැනි දින,
කොළඹ 1, චැතැම් වීදියේ
අංක 62 දරන ස්ථානයේ පිහිටි
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේදී යැ.

10-321

---

## කළුතර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

වර්ෂ 1960 නොවැම්බර් මස 3 වෙනිදා පෙරවරු 9.30 දක්වා පහත සඳහන් සුළු වාරිමාර්ග වැඩ සඳහා මේ කච්චේරියේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර මා විසින් භාරගනු ලැබේ.

කළුතර තොටමුණ.

(1) ඇටවර ඇල ප්‍රමාණකයක් (රෙගියුලේටර්) තැනීම—ජාවත්ත,

පානදුර තොටමුණ.

(1) හාලියපිටිය ඇල යථා තත්ත්වයට පැමිණවීම—තන්තිරිමුල්ල.

නැගෙනහිර පස්දුන් කෝරළය.

(1) මහාන් ඇල අමුණ තැනීම—වරකාගොඩ.
(2) ගම ඇල අමුණ තැනීම—කුඩලිගම.

2. එක් එක් වැඩය වෙනුවෙන් රු. 10 බැගින් මේ කච්චේරියේ තැන්පත් කිරීමෙන් මේ පිළිබඳ ආකෘති පත්‍ර 1960 නොවැම්බර් මස 2 වෙනි දින පස්වරු 3 දක්වා ලබාගැනීමට පුළුවන.

3. ටෙන්ඩර් පත්‍ර, නොවැම්බර් මස 3 වෙනි දින පෙරවරු 10 ට විවෘත කරන අවස්ථාවේදී ඉල්ලුම් කරුවන්ට පෙනී සිටීමට ඉඩ දෙනවා ඇත. මේ පිළිබඳ වැඩි විස්තර ආකෘති පත්‍ර නිකුත් කිරීම අවසන් වන දින දක්වා මේ කච්චේරියෙන් විමසා දැනගත හැක.

ඩබ්ලිව්. සී. විජේසිංහ,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

කච්චේරිය, කළුතර,
1960.10.4.

10-190

---

## 1960 කතරගම ඉල්මහ කාන්ති උත්සවය.

ඉහත සඳහන් උත්සවය සම්බන්ධයෙන් මෙහි පහත දක්වෙන වැඩ සඳහා 1960 නොවැම්බර් 7 වැනි සඳුදින පෙරවරු 10 දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. කුමන කච්චේරියක හෝ මේ සඳහා රුපියල් 25 ක ටැන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1960 නොවැම්බර් මස 3 වැනි දින දක්වා මොණරාගල දිසාපතිගෙන් නියමිත ටැන්ඩර් පෝර්ම ලබා ගත හැක. පිලිගත් ටැන්ඩර්කරුට එකෙනෙහිම ගිවිසුම්පත්‍ර අත්සන් කිරීමට හැකිවන පරිදි ටැන්ඩර් විවෘත කරන අවස්ථාවේදී සියළුම ටැන්ඩර්කරුවන් පැමිණ සිටිය යුතුය. 1960.11.7 වැනි දින පෙරවරු 10.30 ට ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

"තාවකාලික කානු කක්කුස්සි 100ක් සෑදීම—අක්කර නවයක ලඳු කැලයක් ශුද්ධ කිරීම".

ටැන්ඩර් පත්‍ර බහා එවන සියලුම ලියුම් කවර සීල් තබා තිබිය යුතු අතර "කතරගම ඉල්මහ කාන්ති උත්සවය සඳහා ටැන්ඩර් පත්‍ර යයි" යන්න සඳහන් කොට තිබිය යුතුයි. ආණ්ඩුවේ ඒජන්තතුමාට ටැන්ඩර් පත්‍ර හේතු ඉදිරිපත් නොකොට ප්‍රතික්ෂේප කිරීමේ බලය ඇත. පිළිගත් ටැන්ඩර්කරු ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට පෙර ටැන්ඩර් කරන ලද මුදලෙන් සියයට 10ක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපතිතුමන්ගෙන් ලබාගත හැකිය.

ඇල්. ඇන්. ද ඇල්. බංඩාරනායක,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1960.10.8 වැනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේදීය.

10-302

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ කෙහෙල්ඔවිටිගම මධ්‍යම පංති ව්‍යාපාරයට තනන පාරේ බෝක්කු හයක් තැනීම

රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පහත සඳහන් වැඩ කොටස් සඳහා ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ රු. 5,000ක හෝ ඊට වැඩි වටිනාකමක් ඇති වැඩ කිරීම සඳහා ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් වර්ෂ 1960 නොවැම්බර් මස 10 වෙනි දින දහවල් 12 දක්වා භාරගනු ලැබේ.

(ඒ) අඩි 2 × අඩි 2 × අඩි 16 බෝක්කු 5ක් තැනීම, සහ
(බී) අඩි 3 × අඩි 3 × අඩි 16 බෝක්කු 1ක් තැනීම.

2. අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම රත්නපුර කච්චේරියෙන් 1960 ඔක්තෝබර් මස 27 වෙනි දින දහවල් 12 දක්වා ලබාගත හැක.

3. ඉහත සඳහන් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා රු. 100.00 කච්චේරියේ තැන්පත් කළ යුතුයි.

4. රත්නපුර කච්චේරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් තැන්පත් කළ යුතුයි. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එසේත් නැතිනම් ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත අත්සන් කරන නිලධාරිතැනට බාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් විය යුතු අතර සීල් තබන ලද කවරයක බහාලිය යුතුයි. එම කවරයේ වම් පස උඩ කෙළවරේ " කෙහෙල්ඔවිටිගම පාරේ බෝක්කු 6ක් තැනීම සඳහා ටෙන්ඩර් පත්‍රයයි " යනුවෙන් සඳහන් කළ යුතුයි.

5. ටෙන්ඩර්කරුවන් විසින් තම ටෙන්ඩරය පිළිගත් බව දන්වා සතියක් ඇතුළතදී වැඩ කොටස නිසියාකාර ඉටු කිරීම සඳහා ගිවිසුමකට බැඳීමට සූදානම්ව සිටිය යුතුයි. ටෙන්ඩරය පිළිගත් බව දන්වා සතියක් ඇතුළතදී ගිවිසුමකට බැඳීමට අපොහොසත්වන කොන්ත්‍රාත්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරන අතර ඔහුගේ නම කොන්ත්‍රාත් පැහැර හරින්නන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

6. පිළිගත් ටෙන්ඩර්කරුවන් විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් සියයට 10කට වැඩි මුදලක් ඇප වශයෙන් තැබීමට සූදානම්ව සිටිය යුතුයි. එම මුදල ආපසු ගෙවන්නේ කොන්ත්‍රාත්තුව අනුව අවසාන මුදල ගෙවා තුන් මාසයකට පසුවය.

7. ටෙන්ඩර් පත්‍රයේ ඇති සියුම් කටුගෑම්, මැකීම් සහ වෙනස් කිරීම් ආදිය ටෙන්ඩර්කරුගේ කොට අත්සන තබා සහතික කළ යුතුයි.

8. මෙම වැඩ කොටස් 1961 අප්‍රේල් මස 30දාට ප්‍රථම අවසන් කළ යුතුයි.

9. 1960 නොවැම්බර් මස 10 වෙනි දින පස්වරු 2.30ට රත්නපුර කච්චේරියේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් විසින් එදින නියමිත වේලාවට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා ඉදිරියේ පෙනී සිටිය යුතුයි.

10. ටෙන්ඩර් සියල්ල ප්‍රතික්ෂෙප කිරීම හෝ ටෙන්ඩරයක යම්කිසි කොටසක් පිළිගැනීමේ බලය දිසාපති තුමා සතුව පවතී.

11. වෙනත් අවශ්‍ය කරුණු සහ බැලීම සඳහා ප්ලෑන් ද කච්චේරියෙන් ලබාගත හැක.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙනුවට.

කච්චේරිය, රත්නපුර,
1960 ඔක්තෝබර් මස 3 වෙනි දින.

10-114

---

## අනුරාධපුර නව ගුවන් තොටුපල

### පස් එහා මෙහා කිරීමේ යන්ත්‍ර මගින් බිම සකස් කිරීම

මේ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 නොවැම්බර් මස 9 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අනුරාධපුර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 28 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 4,69,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : " වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල් කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඊාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය. 60. 10. 10.

10-350/1

---

## ප්‍රාදේශීය කාර්යාලයක් තැනීම

### (ඇස්. එච්. ඇස්.)—මාතලේ

මේ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි ප්‍රවාහණය හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 නොවැම්බර් මස 9 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මාතලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960, ඔක්තෝබර් මස 28 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,50,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : " වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඊාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය. 60. 10. 10.

10-350/2

---

## ගාලු මුව දොර මහලේකම් කාර්යාලීය ගොඩනැගිලිවල පිළිවල වතුර කාන්දුවීම වැලැක්වීම

මේ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 නොවැම්බර් මස 2 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ-බස්නාහිර කොට්ඨාශය භාර (ගොඩනැගිලි) ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 21 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය. 60. 10. 10.

10-350/3

---

## රජයේ ආරෝග්‍ය ශාලාව—දඹුල්ල

### ඇඳන් 12 කින් යුත් ළමයින්ගේ වාට්ටුවක් තැනීම

මේ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 නොවැම්බර් මස 2 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. නාලන්දේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960, ඔක්තෝබර් මස 21 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 28,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය. 60. 10. 10.

10-350/4

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## රාජකීය ලංකා නාවික හමුදාව

1960 අගෝස්තු මාසයේදී ටෙන්ඩර් සම්බන්ධයෙන් ගන්නා ලද අවසාන තීරණ.

1. සේවය.—කොළඹ නාවික හමුදවට ඉදිආප්ප ආදිය සැපයීම.

ලැබූ ටෙන්ඩර් ගණන : හතයි (7).
තෝරාගත් ටෙන්ඩර්කරු : ඩී. ඊ. නානායක්කාර මහතා.

පිළිගත් ගාස්තු :—

| | ශ. |
|---|---|
| ඉදිආප්ප ... ... | 02½ |
| රොටී ... ... ... | 08 |
| පිට්ටු රාත්තල් ½ බම්බුවක් ... | 45 |
| තෝස ... ... ... | 08 |
| ආප්ප ... ... ... | 04 |

2. සේවය.—දියතලාවේ නාවික හමුදවට පාන්, ඉදිආප්ප ආදිය සැපයීම.
ලැබූ ටෙන්ඩර් ගණන : හතරයි (4)

තෝරාගත් ටෙන්ඩර් කරු : ඩබ්ලිව්. ජානිස් අප්පුහාමි මහතා, යුනියන් හෝටලය, දියතලාව

පිළිගත් ගාස්තු :—

| | ශ. |
|---|---|
| පාන් ... ... ... | 26 |
| බනිස් ... ... ... | 08 |
| ඉදිආප්ප ... ... | 04 |
| රොටී ... ... ... | 08 |
| තෝසෙ ... ... ... | 06 |
| පිට්ටු ... ... ... | 50 |
| ආප්ප ... ... ... | 05 |

3. සේවය.—කාරියනගර්හි නාවික හමුදවට පාන්, ඉදිආප්ප ආදිය සැපයීම

ලැබුණු ටෙන්ඩර් ගණන එකයි (1)
තෝරාගත් ටෙන්ඩර්කරු :—ඒ. එස්. ආරුමුගම් මහතා

පිළිගත් ගාස්තු :—

| | ශ. |
|---|---|
| පාන් ... ... ... | 28 |
| බනිස් ... ... ... | 15 |
| ඉදිආප්ප ... ... | 07 |
| රොටී ... ... ... | 12 |
| තොසෙ ... ... ... | 12 |
| පිට්ටු ... ... ... | 90 |
| ආප්ප ... ... ... | 10 |

4. සේවය.—ත්‍රිකුණාමලේ නාවික හමුදවට පාන්, ඉදිආප්ප ආදිය සැපයීම

ලැබුණු ටෙන්ඩර් ගණන : හතරයි (4)
තෝරාගත් ටෙන්ඩර්කරු : ඕ. එල්. ඒ. රහීම් මහතා.

පිළිගත් ගාස්තු :—

| | ශ. |
|---|---|
| පාන් ... ... ... | 25½ |
| බනිස් ... ... ... | 09½ |
| ඉදිආප්ප ... ... | 05 |
| රොටී ... ... ... | 11 |
| තෝසෙ ... ... ... | 09½ |
| පිට්ටු ... ... ... | 75 |
| ආප්ප ... ... ... | 06 |

5. සේවය.—කොළඹ නාවික හමුදවට එළවලු සහ පළතුරු සැපයීම.

ලැබුණු ටෙන්ඩර් ගණන : නවයයි (9)
තෝරාගත් ටෙන්ඩර්කරු : එම්. ජී. ඩබලිව්. පෙරේරා මහතා.

පිළිගත් ගණන් :—

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| අර්තාපල් ... | රාත්තලක් | ... | 0 | 23 |
| බතල ... ... | එම | ... | 0 | 15 |
| අලවර්ග—ඉන්නල ... | එම | ... | 0 | 20 |
| දෙහිඅල ... | | ... | 1 | 0 |
| රටඅල ... | | ... | 0 | 50 |
| කිරඅල ... | | ... | 0 | 25 |
| රටලූනු ... ... | | ... | 0 | 23 |
| රතුලූනු ... ... | එම | ... | 0 | 35 |
| පොල් ... ... | ගෙඩියක් | ... | 0 | 15 |
| දෙහි ... ... | රාත්තලක් | ... | 0 | 35 |
| කරපිංච ආදිය ... | එම | ... | 0 | 30 |
| අමු මිරිස් ... ... | එම | ... | 0 | 25 |
| බිලිං ... ... | එම | ... | 0 | 20 |
| අමු ඉඟුරු ... ... | එම | ... | 1 | 0 |
| ගෙඩි ගෝවා ... | එම | ... | 0 | 40 |
| කොල ගෝවා ... | එම | ... | 0 | 20 |

පිළිගත් ගණන් :—

| | | රු. ශ. |
|---|---|---|
| කැරට් | රාත්තලක් | 0 45 |
| ටර්නිප් | එම | 0 30 |
| තක්කාලි | එම | 0 40 |
| බීට්රූට් | එම | 0 35 |
| රාබු | එම | 0 15 |
| ලීක්ස් | එම | 0 40 |
| සලාද කොල | එම | 0 45 |
| නෝකෝල් | එම | 0 20 |
| ගෝවා මල් | එම | 1 50 |
| පිපිඤ්ඤා | එම | 0 20 |
| බෝංචි (මුරුංගා සහ කොළ) | එම | 0 40 |
| බටර් බෝංචි | එම | 0 50 |
| නිවිති | එම | 0 20 |
| රටදෙල් | එම | 0 08 |
| ගැට පොලොස් | එම | 0 25 |
| වම්බටු | එම | 0 20 |
| අළු කෙසෙල් | එම | 0 18 |
| බන්ඩක්කා | එම | 0 25 |
| මුරුංගා | එම | 0 20 |
| මෑකරල් | එම | 0 25 |
| වට්ටක්කා | එම | 0 08 |
| දියලබු | එම | 0 10 |
| පතෝල | එම | 0 15 |
| කරවිල | එම | 0 30 |
| මාලු මිරිස් | එම | 0 50 |
| මුකුණුවැන්න | එම | 0 07 |
| ගොටුකොළ | එම | 0 40 |
| කතුරු මුරුන්ගා | එම | 0 60 |
| තම්පලා | එම | 0 35 |
| සාරන | එම | 0 15 |
| කොහිලඅල | එම | 0 30 |
| කොහිල දලු | එම | 0 15 |
| ලූණු කොළ | එම | 0 30 |
| වැටකොළු | එම | 0 20 |
| සැල්දිරි | එම | 0 60 |
| පාර්ස්ලි | එම | 0 90 |
| මිංචි | එම | 0 75 |
| කංකුං | එම | 0 10 |
| කෙසෙල්ගෙඩි (ඇඹුල්) | එම | 0 20 |
| කෙසෙල්ගෙඩි (ආනමාළු) | එම | 0 22 |
| කෙසෙල්ගෙඩි (කෝලිකුට්ටු) | එම | 0 60 |
| දෙඩම් | එම | 0 40 |
| ගස්ලබු | එම | 0 20 |
| අන්නාසි | එම | 0 10 |
| අඹ | එම | 0 50 |
| ඇපල් | ගෙඩියක් | 0 40 |

6. සේවය.—කොළඹ නාවික හමුදාවට මස්, බිත්තර ආදිය සැපයීම.
ලැබුණු ටෙන්ඩර් ගණන : (6) හයයි.
තෝරාගත් ටෙන්ඩර් කරු : ඒ. එස්. ආරුමුගම් මහතා

පිළිගත් ගාස්තු :—

| | රු. ශ. |
|---|---|
| මස්, කටු සමඟ | 0 60 |
| මස්, කටු රහිත | 0 80 |
| මොළය | 2 00 |
| බොකු (ශුද්ධකළ) | 0 50 |
| දිව | 1 0 |
| වලිගය | 1 25 |
| පිගුඩු | 2 50 |
| හදවත | 1 25 |
| වකුගඩු | 1 50 |
| එළුමස්, කටු සමග | 2 75 |
| එළුමස්, කටු නැර | 3 0 |
| හරක්මස් ලිංගුස් (මෙරට) | 3 0 |
| හරක්මස් ලිංගුස් (එලිපන්ට් හවුස්) | 3 0 |
| ඌරුමස් ලිංගුස් (මෙරට) | 2 25 |
| ඌරුමස් ලිංගුස් (එලිපන්ට් හවුස්) | 2 50 |
| බේකන් | 4 10 |
| ඌරුමස් | 2 25 |
| කුකුල් පැටව් | 3 0 |
| කුකුල් මස් | 2 40 |
| කිකිළි බිත්තර | 0 26 |

7. සේවය —.කොළඹ නාවික හමුදාවට මාළු සහ කරවල සැපයීම.
ලැබුණු ටෙන්ඩර් ගණන : (11) එකොළහයි.
තෝරාගත් ටෙන්ඩර්කරු : ඩබ්ලිව්. එස්. ද මෙල් සහ පුත්‍ර මහත්වරු

පිළිගත් ගණන් :—

| මාලු— | රු. ශ. |
|---|---|
| තෝරා (ශුද්ධකළ) | 2 0 |
| ගල්මාළු (බොකුහැර) | 1 10 |
| කොකුඩුවා (බොකුහැර) | 1 20 |
| පරවා (බොකුහැර) | 1 25 |
| අංජීලා (බොකුහැර) | 1 60 |
| බලයා (බොකුහැර) | 1 0 |
| කුම්බලාවා (ශුද්ධනොකළ) | 1 0 |
| කෙලවල්ලා (ශුද්ධකළ) | 1 15 |
| තලපත් (ශුද්ධකළ) | 1 15 |
| ඉස්සන් කුඩා (ශුද්ධනොකළ) | 1 40 |
| ඉස්සන් ලොකු (ශුද්ධ නොකළ) | 1 80 |
| **කරවල—** | |
| පරා | 1 20 |
| කට්ටාවා | 0 85 |
| තෝරා | 1 70 |
| කොඩුවා | 1 20 |
| තෝන්ඩයා | 1 10 |
| කුම්බලා | 0 60 |
| හාල්මැස්සන් | 0 90 |
| තම්බාපු ඉස්සන් | 1 20 |
| බොම්බිලි | 0 60 |

8. සේවය.—කාරියනගර්හි නාවික හමුදාවට මස්, මාළු ආදිය සැපයීම.
ලැබුණු ටෙන්ඩර් ගණන : (4) හතරයි.
තෝරාගත් ටෙන්ඩර්කරු : ඒ. එස්. ආරුමුගම් මහතා

පිළිගත් ගණන් :—

| මස්— | රු. ශ. |
|---|---|
| මස් කටු සහිත | 0 65 |
| මස් කටු රහිත | 0 80 |
| පීකුදු | 2 0 |
| හදවත | 1 0 |
| වකුගඩු | 1 0 |
| බොකු | 0 40 |
| **මාළු—** | |
| තෝරමාළු | 1 90 |
| ගල්මාළු | 1 50 |
| කොඩුවා | 1 25 |
| පරවා | 1 50 |
| අංජීලා | 1 0 |
| කුම්බලා | 1 10 |
| **කරවල—** | |
| පරා | 1 60 |
| කට්ටාවා | 1 25 |
| තෝරා | 1 50 |
| කොඩුවා | 1 25 |
| එළුමස් කටු සහිත | 2 0 |
| එළුමස් කටු රහිත | 2 70 |
| බේකන් (පිටරට) | 4 0 |
| කුකුළු පැටව් | 3 0 |
| කුකුළු මස් | 2 50 |
| කිකිළි බිත්තර | 0 26 |
| කෙලවල්ලා | 1 20 |
| ඔට්ටි | 0 60 |
| ඉස්සන් (කුඩා) | 0 80 |
| ඉස්සන් (ලොකු) | 1 10 |
| කකුළුවන් | 1 75 |
| කුම්බිලා | 1 20 |
| හාල්මැස්සන් | 1 0 |
| ඉස්සන් (පොතුරහිත වියලි) | 1 20 |

9. සේවය.— ත්‍රිකුණාමලයේ නාවික හමුදවට මස් සැපයීම

ලැබුණු ටෙන්ඩර් ගණන : (6) හයයි

තෝරාගත් ටෙන්ඩර්කරු : ජී. එම්. බාවා මහතා

පිළිගත් ගණන් :—

| | රු. | ශ. |
|---|---|---|
| මස් කටුසහිත | 0 | 57 |
| මස්, කටුරහිත | 0 | 75 |
| මොල | 1 | 50 |
| බොකු (ශුද්ධකරන ලද) | 0 | 35 |
| දිව | 0 | 80 |
| වලිගය | 0 | 67 |
| පිකුදු | 1 | 95 |
| හදවත | 1 | 15 |
| වකුගඩු | 1 | 20 |
| එළුමස්, කටුසහිත | 2 | 25 |
| එළුමස් කටුරහිත | 2 | 70 |
| හරක්මස්ලිංගුස් (මෙරට) | 1 | 50 |
| හරක්මස් ලිංගුස් (එලිපන්ටිහවුස්) | 2 | 40 |
| ඌරුමස් ලිංගුස් (මෙරට) | 1 | 75 |
| ඌරුමස් ලිංගුස් (එලිපන්ටිහවුස්) | 2 | 60 |
| බේකන් | 5 | 25 |
| ඌරුමස් | 1 | 70 |

10. සේවය.—ත්‍රිකුණාමලයේ නාවික හමුදවට ගොවිපල්හි නිෂ්පාදිත ද්‍රව්‍ය සැපයීම.

ලැබුණු ටෙන්ඩර් ගණන : (6) හයයි.

තෝරාගත් ටෙන්ඩර්කරු :කේ. කේ. වේලායුද පිල්ලේ මහතා.

පිළිගත් ගණන් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| කුකුල් පැටව් | රාත්තලක් | 2 | 0 |
| කුකුළු මස් | එම | 2 | 25 |
| කිකිළි බිත්තර | එකක් | 0 | 25 |

11. සේවය.—ත්‍රිකුණාමලයේ නාවික හමුදවට මාළු සැපයීම.

ලැබුණු ටෙන්ඩර් ගණන : (7) හතයි.

තෝරාගත් ටෙන්ඩර්කරු : ජේ. පී. ගුණදස මහතා

පිළිගත් ගණන් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| තෝරා (ශුද්ධකළ) | රාත්තලක් | 1 | 80 |
| ගල්මාළු (බොකු අස්කළ) | එම | 1 | 10 |
| කොඩුවා (බොකු අස්කළ) | එම | 1 | 15 |
| පරවා (බොකු අස්කළ) | එම | 1 | 40 |
| අංජිලා (බොකු අස්කළ) | එම | 1 | 35 |
| බලයා (බොකු අස්කළ) | එම | 1 | 15 |
| කුම්බිලා | එම | 0 | 75 |
| තලපත් (ශුද්ධකළ) | එම | 1 | 25 |
| කෙලවල්ලා (ශුද්ධකළ) | කම | 1 | 40 |
| ඉස්සන් (කුඩා) ශුද්ධකළ) | එම | 1 | 20 |
| ඉස්සන් (කුඩා) | | 1 | 20 |
| ඉස්සන් (ලොකු) | | 1 | 65 |
| කකුළුවන් | | 0 | 55 |

12. සේවය.—ත්‍රිකුණාමලේ නාවික හමුදවට කරවල සැපයීම.

ලැබුණු ටෙන්ඩර් ගණන : (7) හතයි.

තෝරාගත් ටෙන්ඩර්කරු : ඒ. එස්. එම්. ජෙගනාදන් සහ සමාගම

පිළිගත් ගණන් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| පරා | රාත්තලක් | 1 | 40 |
| කට්ටාවා | එම | 1 | 20 |
| තෝරා | එම | 1 | 50 |
| කොඩුවා | එම | 1 | 20 |
| තොන්ඩයා | එම | 1 | 40 |
| කුම්බිලා | එම | 0 | 60 |
| හාල්මැස්සන් | එම | 1 | 0 |
| ඉස්සන් (වියළි, පොතුහැරපු) | එම | 1 | 20 |

13. සේවය.—ත්‍රිකුණාමලේ නාවික හමුදවට එලවළු සහ පලතුරු සැපයීම.

ලැබුණු ටෙන්ඩර් ගණන : (7) හතයි.

තෝරාගත් ටෙන්ඩර්කරු : ජේ. පී. ගුණදස මහතා

පිළිගත් ගණන් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| අර්තාපල් | රාත්තලක් | 0 | 34 |
| බතල | එම | 0 | 16 |
| රටළූනු | එම | 0 | 25 |
| රතුළූනු | එම | 0 | 18 |
| පොල් | ගෙඩියක් | 0 | 19 |
| දෙහි | රාත්තලක් | 0 | 25 |
| කරපිංචා | එම | 0 | 20 |
| අමුමිරිස් | එම | 0 | 40 |
| අමු ඉඟුරු | එම | 0 | 40 |
| ගෙඩිගෝවා | එම | 0 | 50 |
| කැරට් | එම | 0 | 45 |
| ටර්නිප් | එම | 0 | 20 |
| බීට්රූට් | එම | 0 | 45 |
| ලීක්ස් | එම | 0 | 45 |
| රාබු | | 0 | 25 |
| සලාදකොල | එම | 0 | 40 |
| පාර්ස්ලි | | 0 | 40 |
| සැල්දිරි | එම | 0 | 40 |
| මිංචි | එම | 0 | 40 |
| බිලිං | එම | 0 | 25 |
| අළු කෙහෙල් | එම | 0 | 25 |
| බන්ඩක්කා | එම | 0 | 35 |
| බටර් බෝංචි | එම | 0 | 50 |
| බෝංචි (මුරුංගා සහ කොල) | | 0 | 50 |
| වම්බටු | එම | 0 | 30 |
| පිපිංඤ | එම | 0 | 15 |
| ගෝවා මල් | එම | 1 | 10 |
| මෑකරල් | එම | 0 | 40 |
| මාළු මිරිස් | එම | 0 | 50 |
| නෝකෝල් | එම | 0 | 30 |
| වට්ටක්කා | එම | 0 | 15 |
| පතෝල | එම | 0 | 28 |
| කරවිල | එම | 0 | 15 |
| දියලබු | එම | 0 | 35 |
| තක්කාලි | එම | 0 | 50 |
| කිරිඅල | එම | 0 | 30 |
| ඉන්නල | එම | 0 | 10 |
| දෙහිඅල | එම | 0 | 15 |
| මුරුංගා | එම | 0 | 35 |
| වැටකොළු | එම | 0 | 25 |
| රටදෙල් | එම | 0 | 15 |
| කොහිල අල | එම | 0 | 28 |
| කොහිල දළු | එම | 0 | 28 |
| කංකුං | එම | 0 | 15 |
| කතුරුමුරුංගා | එම | 0 | 20 |
| මුකුණුවැන්න | එම | 0 | 20 |
| නිවිති | එම | 0 | 22 |
| තම්පලා | එම | 0 | 15 |
| සාරන | එම | 0 | 15 |
| ගොටුකොල | එම | 0 | 25 |
| ළූනු කොල | එම | 0 | 30 |
| දොඩම් | එම | 0 | 50 |
| අන්නාසි | එම | 0 | 25 |
| ගස්ලබු | එම | 0 | 12 |
| අඹ (යාපනේ හෝ බෙට්ටි) | එම | 0 | 30 |
| කෙසෙල්ගෙඩි (ඇඹුල්) | එම | 0 | 27 |
| කෙසෙල් (කෝලිකුට්ටු | එම | 0 | 50 |
| කෙසෙල්ගෙඩි (ආනමාලු) | එම | 0 | 27 |
| ඇපල් | එකක් | 0 | 32 |

ජී. ආර්. ඇම්. ද මැල්,
රියර් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

නාවික හමුද මූලස්ථානය,
කොඩිගහ වීදිය,
කොළඹ 1.
1960 ඔක්තෝබර් මස 7 වැනි දින.
10-267

## බඩු බාහිරාදිය විකිණීම

### රාජකීය ලංකා නාවික හමුදාව

1960 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා පෙ. ව. 10 ට ත්‍රිකුණාමල යෙහි නෞකා තටාකාංගණයේ, අභ්‍යන්තර අඩගණයෙහි විකිණීම් ගබඩාවෙහිදී පාවිච්චියට නුසුදුසු බඩු වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. විකුණනු ලබන දිනයෙහි 0700 සිට භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැකිය.

3. වෙන්දේසිය අවසානයේදී සම්පූර්ණ ගණන ගෙවීම අවශ්‍ය වේ.

4. විකුණනු ලබන දිනයෙහි දී නෞකා තටාකාඩගණයට ඇතුළු වීම සහ මිලදී ගන්නා ලද භාණ්ඩ ඉවත් කිරීම සඳහා අවසර පත්‍ර ත්‍රිකුණාමලය භාරකාර නාවික නිලධාරි තැනගෙන් ඉල්ලුම් පත්‍රයක් යවා ලබා ගත යුතුය.

10-136

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### වෙන්දේසියේ විකිණීමයි

1960 ඔක්තෝබර් මස 26 වන දින පෙරවරු 10ට ත්‍රිකුණාමලයේ රජයේ ගොවිපලේදී දෙමුහුන් "යමුනාපාරි" එළු දෙනුන් 23 ක්ද එළුවැස්සියන් 17 දෙනෙකු හා එළු වස්සන් 7 දෙනෙකු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනනු ලැබේ. ගැනුම් කරුවන් විසින් වෙන්දේසිය අවසන්වූ වහාම මුදල් ගෙවා සතුන් ගොවිපලෙන් ඉවත් කළ යුතුයි.

මෙම සතුන් සතියේ සෑම දිනකම පෙරවරු 7 සහ පස්වරු 4 ඇතුළත දී ඉහතකී ගොවිපලේදී බැලිය හැක.

ඒ. වී. රිචර්ඩ්ස්,
වැඩබලන ගොවිකම් අධ්‍යක්ෂ.

පේරාදෙනියේදීය.

10-165

---

### කැලෑ දෙපාර්තමේන්තුව

කොළඹ, මැක්ලම් පාරේ, කැළණි වැලි ගුඩ්ස් යාඩ්හි ලී ගබඩාවේ තිබෙන බුරුත කොටන් එකසිය තිස් අටක් (138) 1960 වේ ඔක්තෝබර් මස 24 වෙනි සඳුදා උදේ 9.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ, මැක්ලම් පාරේ කැළණි වැලි ලී ගබඩාව භාරකරුගෙන් දැනගත හැක.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

තැ. පෙ. 509,
කිච් පාර,
කොළඹ, 2.

10-303

---

### හරක් වෙන්දේසියක්

කොච්චුච්චියේ වඩත්ත රජයේ පාසැලට අයත් මෙහි පහත දැක්වෙන හරක් 1960 ඔක්තෝබර් මස 22 වැනි දින පෙරවරු 10.30 ට ඉහත සඳහන් පාසැලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

එළදෙනුන් —8
ගොන් —7
වසු පැටවුන්—3

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කුරුණෑගල අධ්‍යාපන කාර්යාල යෙන් දැනගත හැක.

ඩී. ඇස්. කලුගම්පිටිය,
කුරුණෑගල වැ. බ. අධ්‍යාපන නිලධාරී.

1960 ඔක්තෝබර් 8 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේදීය.

10-301

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.